

# අපි හොඳ යාළුවෝ

මිනුකි බිහන්සා කොතලාවල

# අපි හොඳ යාළුවෝ



මිනුකි බිහන්සා කොතලාවල

# අපි හොඳ යාළුවෝ

© මිනුකි බිහන්සා කොතලාවල
කර්තෘ ප්‍රකාශනයකි

| | |
|---|---|
| ප්‍රථම මුද්‍රණය | : 2025 පෙබරවාරි 08 |
| ISBN | 978-624-208-215-8 |
| කර්තෘ | : මිනුකි බිහන්සා කොතලාවල |
| චිත්‍ර | : මිනුකි බිහන්සා කොතලාවල |
| පරිගණක අක්ෂර සහ ග්‍රැෆික් නිර්මාණයකරණය | : අවනි රණසිංහ - නෙත්වින් ප්‍රින්ටර්ස් |
| මුද්‍රණය | : ''දළදා සෙවණේ අපි පදනම''<br>ගැටඹේ හන්දිය, මහනුවර<br>081 2 386 908 |

# පිදුම

මාගේ ආදරණීය අම්මාටත්, තාත්තාටත්

සියළුම ගුරු මෑණියන්ටත්,

පියවරුන්ටත් . . . . .

# ස්තුතිය

මා විසින් මුල්ම වරට රචනා කරන ලද''අපි හොඳ යාළුවෝ'' නම් මෙම පොත් පිංච නිර්මාණය කිරීමේ දී මා හට ගුරුහරුකම් දෙමින් වැරදි නිවැරදි කරමින් මාව දිරිමත් කළ පන්තිභාර ගුරුතුමිය වන ලලිතා කුමාරිහාමි ගුරු මෑණියන්ටත්, මෙම පොත් පිංච නිර්මාණය කිරීම සඳහා නිරන්තරව මා හට මඟපෙන්වූ සමන්මලී ගුරු මෑණියන්ටත්, මගේ දයාබර දෙමාපියන්ටත්, අතහිත දුන් සැමටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.

මෙම පොත මුද්‍රණය කර දුන් නෙත්වින් ප්‍රින්ටර්ස් ආයතනයේ අධිපතිතුමා ඇතුළු කාර්යය මණ්ඩලයට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.

මිනුකි කොතලාවල

# පෙරවදන


සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි.


ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන ''හෙරණගත්කරණී'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,<br>
ශශිකලා සේනාධීර,<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකමත් එක ගමක සඳුන්, කමල් කියලා පුංචි
ළමයි දෙන්නෙක් හිටියා.
ඒ දෙන්නා හොඳ යාළුවෝ.
හැමදාම මේ දෙන්නා ඉස්කෝලේ යනවා.
ඉස්කෝලේ ගිහින් ඇවිත් හවසට ගං ඉවුරේ
සෙල්ලම් කරනවා.





එක දවසක් මේ දෙන්නා ගං ඉවුරේ සෙල්ලම් කරමින් සිටියා.
එතකොටම බැලුම් බැලුම් කියාගෙන බැලුම්
මාමා කෙනෙක් පාරේ යනවා දැක්කා.
මේ දෙන්නටත් බැලුම් ගන්න ඕනේ කියලා හිතුනා.

ඉතින් මේ දෙන්නා බැලුම් දෙකක් ගත්තා. ඒ දෙන්නා බැලුම් අරගෙන සෙල්ලම් කළා. ටික වෙලාවක් යනකොට ලොකු හුළඟක් ආවා. මේ යාළුවෝ දෙන්නාට ඒ ගැන දැනුනේ නැහැ. ඒ දෙන්නා සෙල්ලම් කරමින් හිටියා. එකපාරටම කමල් අහසේ පාවෙන්න පටන් ගත්තා. සඳුන් ඒ පස්සෙන්ම දුවගෙන ගියා.

ටික දුරක් යනකොට පාළු පිට්ටනියක් හම්බ වුණා. ඒ පාළු පිට්ටනියේ මැද ලස්සන පුංචි ගෙයක් තිබුණා. කමල් ඒ ගෙදර ඇතුළට පාවෙලා ගියා.



සඳුන් ඒ ගෙදර දොර අරින්න
යනකොටම ගෙදර ඇතුලේ ඉදලා එළියට ආව
විශාල පිඹුරෙක් සඳුන්ව වෙලා ගන්න ගියා.
සඳුන් පිඹුරගෙන් බේරුණා.
එයාට ගොඩක් බය හිතුණා.
එයා අඬන්න පටන් ගත්තා.

එතන හිටිය කුරුල්ලෙක් කිවුවා ඔයා අඬන්න එපා
මම ඔයාට එයාව බේරලා දෙන්නම්. කොහොමද?
ඒ ගෙදර ඇතුළෙ ඉන්නේ නපුරු මායාකාරයෙක්.






ඉතින් දැන් අපි මොකද කරන්නේ. මම ඔයාට ගෙදර
ඇතුළට ගිහින් දාන්නම්. ඔයා පිඹුරගෙන් බේරිලා
යාළුවා බේරගෙන එළියට පැනගන්න.
මායාකාරයාගේ ඉනේ මායා යෂ්ටියක් තියෙනවා.

ඒ මායා යෂ්ටියේ තමයි මායාකාරයාගේ බලය තියෙන්නේ.

ස්තූති කුරුළු පැටියෝ මම ඒ විදියට කරන්නම්.




ඊට පස්සේ කුරුළු පැටියා සඳුන්ව
ගේ ඇතුළට ගිහින් දැම්මා. ඇතුළට ගියාම
සඳුන් දැක්කා මායාකාරයා නිදියගෙන ඉන්නවා.





සඳුන් හෙමින් හෙමින් එතනට ගිහින්
මායා යෂ්ටිය අතට අර ගත්තා.
සඳුන් මායා යෂ්ටිය අතට
ගන්නකොටම මායාකාරයා නැති වුණා.
ඒත් එක්කම එක කාමරයකින් අඬන සද්දයක් ඇසුනා.
ඒ කටහඬ එයාගේ යාළුවා කමල්ගේ කටහඬ වගෙයි.



සඳුන් ඉක්මනට ගිහින් ඒ කාමරයේ දොර ඇරියා.
එයාගේ යාළුවා කමල් අඬ අඬා ඉන්නවා දැක්කා.



කමල්ට ගොඩාක් සතුටු හිතුණා.
සඳුන් කමල්ව බදා ගත්තා.
කමල් සඳුන්ට ස්තූති කළා.

තමන්ගේ යාළුවන්ව කරදරේ වැටුණු
වේලාවට ඒ අයට උදව් කරන එක
හොඳ දරුවෙක්ගේ ලක්ෂණයක් කියලා
අපේ ගුරුතුමිය දවසක් අපට
කියලා දුන්නා. ඊට පසු දෙන්නම
සතුටින් ගෙවල් වලට යන්න ගියා.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

**මිනුකි බිහන්සා කොතලාවල**
**කර්තෘ**



9786242082158